WWW.OLEVELAPI.COM

OL/2016/21/S-I, II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது [All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2016 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2016 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2016

| | | |
|---|---|---|
| සිංහල භාෂාව හා සාහිත්‍යය | I, II | පැය තුනයි |
| சிங்களமொழியும் இலக்கியமும் | I, II | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | I, II | Three hours |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40**ක් ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

**1.** නැගී සිටින්නට වෙර දරන අයට **අත දීම** හොඳ පුරුද්දකි.
(1) ප්‍රශංසා කිරීම (2) උදවු කිරීම
(3) මිල මුදල් දීම (4) අගය කිරීමට ලක් කිරීම

**2.** ගුරුවරු දරුවන් වෙත **ඇහැ ගහගෙන** බලා සිටිති.
(1) සෝදිසියෙන් යුතුව (2) කරබාගෙන
(3) අනුකම්පාවෙන් (4) ඇස් දල්වාගෙන

**3.** ප්‍රධානියාගේ **මුනිවත රැකීම** සේවකයන්ට ප්‍රහේලිකාවක් විය.
(1) ආගම සිහි කිරීම (2) දැස් පියාගෙන සිටීම
(3) නිශ්ශබ්දව සිටීම (4) කලබලකාරී වීම

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

**4.** මුද්‍රණ ශිල්පය පැමිණීමත් සමග පොත්පත් .............................. ව්‍යාප්ත වන්නට විය.
(1) අවකාශය (2) විකාශනය (3) ප්‍රකාශනය (4) විකාශය

WWW.OLEVELAPI.COM

**5.** ශ්‍රී මහා බෝධි වෘක්ෂය පරිත්‍යාග කරන ලද්දේ දේවානම් පියතිස්ස රජුට ........................ ඉන්දියානු පාලකයා වූ අශෝක රජු විසිනි.
(1) අර්ධකාලීන (2) සමකාලීන (3) පශ්චාත්කාලීන (4) යාවත්කාලීන

**6.** සාහිත්‍ය නිර්මාණයක් තුළ අපූර්වත්වයක් ද ..................... ද පැවතිය යුතු ය.
(1) අර්ථාන්විතභාවයක් (2) විස්මිතභාවයක් (3) සමලංකෘතභාවයක් (4) කරුණාන්විතභාවයක්

**7.** අකාරාදි පිළිවෙළ නිවැරදි ව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) කහවණු, කස්තුරි, කාටිලේජ, කැඩපත (2) ජනාධිපති, ජනප්‍රවාද, ජලජ, ජාතිකාභිමානය
(3) තරලය, තරුණ, තලතුනා, තානාපති (4) පලාපල, පාචනය, පාවාඩය, පාරිභෝගික

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ස්වාභාවික, ආධ්‍යාත්මික, ප්‍රස්තාවනාව, අවස්ථෝචිත
(2) ව්‍යංග්‍යාර්ථය, විද්‍යාමාන, නීත්‍යානුකූල, කොට්ඨාසය
(3) නිශ්ශබ්දතාව, ප්‍රේම වෘතාන්තය, දන්ත ශල්‍යාගාරය, අත්‍යවශ්‍ය
(4) පුස්තකාලය, න්‍යෂ්ඨික ප්‍රහාරය, යුධ රහස්, විද්‍යුත් උපකරණ

[දෙවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**9.** එක් එක් වචනවල මුලකුරෙහි **ඇදය, දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල** සහ **ඇලපිල්ල** පිළිවෙළින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.

(1) කැත්ත, කුල්ල, මිට, කාලය
(2) වැලි, නූල, ගිරය, කාලය
(3) දෙබල, මුල්ල, දූපත, වැට
(4) ගෙදර, රූපය, මී කිරි, මාලය

**10.** 'අනවශ්‍ය' යන වචනය අයත් වන්නේ,

(1) විශේෂණ සමාසයට ය.
(2) විභක්ති සමාසයට ය.
(3) අන්‍යාර්ථ සමාසයට ය.
(4) අව්‍යය සමාසයට ය.

**11.** "පොලිස් නිලධාරීන් විසින් සිදුකරන ලද මෙහෙයුමේ දී සොරුන් පැනගිය ද සොරාගත් භාණ්ඩ සොයා ගැනිණි." යන වාක්‍යයේ උක්තය වන්නේ,

(1) සොරාගත් භාණ්ඩ ය.
(2) මෙහෙයුමේ දී ය.
(3) පොලිස් නිලධාරීන් ය.
(4) සොරුන් ය.

**12.** මිනිසාගේ යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කළ විට නිවැරදි ව දැක්වෙන්නේ කෙසේ ද?

(1) මිනි + සාගේ (2) මිනිසා + ගේ (3) මිනිස් + ආගේ (4) මිනිසා + අගේ

**13.** "නිලධාරීන් විසින් ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කරන ලදි." යන වාක්‍යයේ 'නිලධාරීන්' යන පදය අයත් වන විභක්තිය වන්නේ,

(1) ප්‍රථමා ය. (2) කර්තෘ ය. (3) කර්ම ය. (4) කරණ ය.

● අංක **14** සිට **16** තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන උත්තරය තෝරන්න.

**14.** සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මැතිතුමා යහපත් හා සේවයට කැපවූ ගුරු පරපුරක් බිහිකිරීමෙහිලා **පුරෝගාමී විය.**

(1) මුල් විය (2) නිරත විය (3) උත්සාහවන්ත විය (4) ඉදිරිපත් විය

**15.** භාෂාවේ විවිධ ස්වරූප **සුසංයෝජනයෙන්** කාව්‍යෝක්ති නිර්මාණය කර ගැනීමට කවීහු උත්සාහ කරති.

(1) මනාව සංස්කරණය කිරීමෙන්
(2) අවබෝධයෙන් යුතුව යෙදීමෙන්
(3) ප්‍රකට ලෙස යොදා ගැනීමෙන්
(4) මැනවින් සම්බන්ධ කර ගැනීමෙන්

**16.** විභාග ප්‍රතිඵල දැකීමෙන් ඔහු තුළ ඇති වූ **ප්‍රහර්ෂය** මුහුණේ පිළිබිඹු ව තිබිණි.

(1) දුක්ඛදායක තත්ත්වය
(2) අධික සන්තෝෂය
(3) බියට පත්වූ බව
(4) කලබලයට පත්වූ ස්වභාවය

**17.** මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත උත්තරය තෝරන්න.

(1) නිපාත - සේ, එහෙත්, විසින්, බඳු
(2) කෘදන්ත - ලියුම, තිබුණු, වැටීම, දුවන්නා
(3) තද්ධිත - ජාතික, ධෛර්යවත්, ආයතනික, ස්වදේශීය
(4) උපසර්ග - ප, පර, සිරි, නි

**18.** යමක් වර්ණනා කිරීම, විස්තර කිරීම, ස්වභාවය දැක්වීම සඳහා යෙදෙන පද

(1) කෘදන්ත පදයි. (2) තද්ධිත පදයි. (3) නාම පදයි. (4) විශේෂණ පදයි.

**19.** එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නො වන** පද පේළිය තෝරන්න.

(1) ඉක්මන් - සෙද, පොත - ගත, නිතර - තිබඳ, රත්තරන් - රුවන්
(2) මුහුණ - වත, භයානක - භීම, වීදිය - වේ, අඹ - ජලය
(3) සඳ - සිසි, සිරුර - වෙර, මහත - ස්ථූල, ලුණුව - යොත
(4) අශ්වයා - හය, කුරුල්ලා - සකුණ, උතුම් - පවර, උවදුර - පිරිපත

**20.** 'ඉරබටු තරුව' හැඳින්වීම සඳහා යෙදෙන නමක් **නො වන්නේ** කුමක් ද?

(1) ඕෂධී තාරකාව (2) දවහත් තරුව (3) සැඳෑ තරුව (4) නගුල් තරුව

**21.** විරුද්ධාර්ථවත් පද යුගලයක් **නො වන්නේ** කුමක් ද?

(1) අනුමාන - ප්‍රත්‍යක්ෂ
(2) අභියස - පිටුපස
(3) ප්‍රච්ඡන්න - විවෘත
(4) නිපුණ - ප්‍රවීණ

**22.** පූර්ව ක්‍රියාවක් යෙදී ඇති වාක්‍යය තෝරන්න.

(1) වෙළෙන්දා සේවකයා ලවා කඩය පිරිසිදු කරවයි.
(2) ඔහු නින්දට යද්දී වැස්ස පටන් ගත්තේ ය.
(3) තාරිකා දුරකථනය අතට ගෙන පරීක්ෂා කළා ය.
(4) සමන් සිනා සිසී මා දෙස බැලුවේ ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

23. වැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
(1) පිල්ලම් භාවිතයේ දී ඖ ස්වරය නියෝජනය කිරීම සඳහා ව්‍යංජන අක්ෂර සමග කොම්බුව සහ ගයනුකිත්ත භාවිත කෙරේ.
(2) කණ්ඨජ අක්ෂර යනුවෙන් හඳුන්වන්නේ දිවේ පසු කොටස උගුර දෙසට ළංවීමෙන් උපදින ශබ්දයි.
(3) ක්‍රීඩා කරද්දී යනු අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවකි.
(4) "වෛද්‍යවරයා විසින් රෝගීහු සුවපත් කෙරෙති." යන වාක්‍යයේ රෝගීහු යනු උක්ත කර්මයයි.

24. පූර්ව ස්වර ලෝප සන්ධියට උදාහරණයක් වන්නේ කුමක් ද?
(1) නියංසාය (2) සුරත (3) නිරවුල් (4) මලසුන

25. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණය වන නිවැරදි සම්භාව්‍ය ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.
(1) කු දා ව ස න (2) ය පු ලි ජා න (3) ර මා අ තු ස (4) ණ බු ර ත් ස

- අංක **26, 27** යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

26. එක් කරදරයක් පිට තවත් කරදරයක් පැමිණීම
(1) අලි මදිවට හරක් (2) දී කිරට බළල්ලුත් සාක්කි
(3) අනුන්ට කැපූ වලේ තමනුත් වැටේ (4) උඩ පැන්නොත් බිම වැටේ

27. තමන් නොකරන කාර්යය අනුන්ට ද කිරීමට නොදීම
(1) සෙක්කුවේ බැන්ද හරකා වගේ (2) පිදුරු ගොඩේ ඉන්න බල්ලා වගේ
(3) අතු කඩා මොර කන්නා වගේ (4) පාරුකාරයාගේ උම්බලකඩේ වගේ

28. A - විස්මයාවහ - පුදුමයෙන් තොරව
B - සිවු සඟරාවත - දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාව
C - කෝ ගිනි කඳ - කෝපය නම් ගිනි ජාලාව
D - දැවුරුදු - දෙ + අවුරුදු

A, B, C, D යෙදුම් යුගල අතුරෙන් නිවැරදි යුගල වන්නේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, C හා D පමණි. (4) B, C හා D පමණි.

- අංක **29, 30** යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.

29. (1) ගුරුවරුන්ගේ මෙහෙවර ඇගයෙති. (2) හොඳ ළමයි ප්‍රශංසාවට ලක්වනු ඇත.
(3) මම සංචාරකයෝ සමග මිත්‍ර වීමි. (4) ඔහු දෙවියකු වැනි මිනිසෙක් ය.

30. (1) මාර්ටින් වික්‍රමසිංහ විශිෂ්ට ලේඛකයකු වෙයි.
(2) ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා ප්‍රවීණ සිනමාකරුවෙකුශු.
(3) සමහර මිනිස්සු අවංක නො වන්නේ ඇයි දැයි මට නොතේරේ.
(4) ඔවුන් තරගයට හොඳින් මුහුණ දුන්හයි ගුරුතුමිය පැවසුවා ය.

31. A - ජනාධිපතිතුමා ............................ අගමැතිතුමා සමුළුවට සහභාගි වෙයි.
B - ............................ කතා කරන්න. මා ඔබට උදවු කරන්නම්.
C - දේශකයා පැවසූ කරුණු ............................ විවිධ වාද විවාද ඇති විය.
D - දේශනය ............................ විද්වත් පිරිසක් සහභාගි වූහ.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ කුමක් ද?
E - පිළිබඳ F - නොහොත් G - සඳහා H - නැවත
(1) E, F, G, H (2) E, G, H, F (3) H, F, E, G (4) F, H, E, G

32. පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
"මම ගෙදර එන විට යාළුවන් මුණ ගැහුණා."
(1) මා ගෙදර එද්දී මිතුරන් මුණ ගැසුණෙමි. (2) මම ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණහ.
(3) මා ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණහ. (4) මම ගෙදර එද්දී මිතුරෝ මුණ ගැසුණෙමි.

33. විලියම් ශේක්ස්පියර් විසින් රචනා කරන ලද නාට්‍යයක් **නො වන්නේ**,
(1) ඔතෙලෝ ය. (2) හැම්ලට් ය.
(3) ද කොකේසියන් චෝක් සර්කල් ය. (4) ඇන්තනි ඇන්ඩ් ක්ලියෝපැට්රා ය.

34. උපමාවක් සහිත කවි පදය තෝරන්න.
(1) සිසිවන වුවන ඉඟ සුඟ ගත හැකි මිටින (2) ඇසිපිය හෙළන පමණින් නොවෙති දෙවඟන
(3) විදෙන ලෙළෙන තරුබර පුළුලුකුළ රැඳී (4) සැළලිහිණිය වදු කැලණිය පුරවරට

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**35.** 'එක් තිඹිරි රුකකට නැගී නොවිළික්සුණු එල අනුභව කරනුයේ' යන පාඨයෙහි නොවිළික්සුණු යන වචනයේ අදහස කුමක් ද?
(1) ඉදී නැති (2) නොපිපිරුණු (3) කෑමට නුසුදුසු (4) රසවත් නැති

**36.** පහත සඳහන් ගී ඛණ්ඩයේ හතරවැනි පදය තෝරන්න.

"බලි තරු රාවණ ගැමුණු විජයබා නිරිඳුන් ලද ලංකා
පුලතිසි දැමි සිරි රහල් කුමරතුඟු පඬුවන් ලද ලංකා
විදූ සක්විති මහ පැරකුම් කිවිසුරු කිවියන් ලද ලංකා
..........................................................................."

(1) සමතොළ කිරිගල් පිදුරුතලා ඈ කෙහෙ ගැට බැඳි ලංකා
(2) මුහුදින් අඟලක් ඔබ වැවෙතොත් එහි පනිමු පනිමු ලංකා
(3) තේ වතු පොල් වතු කෙත් වතු පෙළ උකුළේ නළවන ලංකා
(4) ඔබ රැකුණොත් ලෝකුඹුව ද අපහට සීත ගඟුලි ලංකා

**37.** "මගේ මිත්‍ර ඉලෝ සුබොලාඩසේ, මොක ද අපි මේ කාරණාව එළි කළා ම ඇති වැරැද්ද? අබ්ෂ්විල්ලි වතුපිටිවලට අයිතියක් නැද්ද ඔය කොලු පැටියට වගේ ම මේ මනුස්සයට?" යන දෙබස් ඛණ්ඩය ඇතුළත් නාට්‍යය කුමක් ද?
(1) තල මල පිපිලා (2) හුණු වටයේ කතාව
(3) සිංහබාහු (4) කිරිමුට්ටිය ගඟේ ගියා

**38.** හේන් ගොවිතැන ආශ්‍රිත බස්වහරේ දී අලියන් වේලාව යනු,
(1) අලි ගමන් කරන වේලාවයි. (2) රාත්‍රී කාලයයි.
(3) අඳුර වැටෙන වේලාවයි. (4) උදෑසන කාලයයි.

**39.** පහත සඳහන් කවියෙහි අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

"තිරසර ගුණැති සුදනෝ පර වැඩ නැති ද
වර සුර පුරෙහිවත් නො වසති නිරය ලෙද
ගොරතර නිරෙහි වත් පරනට වැඩ ඇති ද
සුර පුර ලෙසට සලකා හැසිරෙත් නිබඳ

(1) ස්ථිරසාරවූ ගුණ ඇති යහපත් මිනිසුන් නරක වැඩ නොකරතත් දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. අන්‍යයන්ට යහපතක් කළ හැකි නම් දිව්‍ය ලෝකය සේ සලකා දුෂ්කර ලෙස අපායේ වුව ද වාසයට කැමතිය.
(2) ස්ථිරසාරවූ ගුණ ඇති යහපත් ජනයා අනෙක් අයට යහපතක් නොවේ නම් උතුම් දිව්‍ය ලෝකය වුවත් අපාය සේ සලකා එහි වාසය නොකරති. එහෙත් අනුන්ට යහපතක් කළ හැකි නම් අතිශය ඝෝර වූ අපායෙහි වුවත් දිව්‍ය ලෝකය සේ සලකා හැසිරෙති.
(3) ස්ථිරසාරවූ ගුණයෙන් යුක්ත යහපත් ජනතාව නරක වැඩ නොකළත් දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. එහෙත් ඝෝර වූ අපායෙහි වුව ද අනුන්ට යහපතක් කළ හැකි නම් දිව්‍ය ලෝකයෙහි මෙන් සලකා වාසය කරති.
(4) ස්ථිරසාර ගුණයෙන් යුක්ත යහපත් ජනතාව නරක වැඩ නොකරන අතර දිව්‍ය ලෝකයෙහිවත් අපායෙහිවත් වාසය නොකරති. ඝෝරවූ විශාල අපායෙහි වුවත් නරක වැඩ නැති නම් එහි දිව්‍ය ලෝකය සේ සලකා නිරන්තරයෙන් හැසිරෙති.

**40.** පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.
"සාහිත්‍යකරුවාගේ නිර්මාණශීලීත්වය හෙළිවන්නේ ඔහු සිය නිර්මාණය සඳහා අර්ථවත් අත්දැකීම් තෝරා ගැනීම හා ඒ අත්දැකීම් පාඨකයාට වින්දනයක් ඇතිවන ආකාරයෙන් නැවත ඉදිරිපත් කිරීම සිදු කර ඇති අන්දම අනුව ය."
(1) සාහිත්‍යකරුවකු තෝරාගන්නා අරුත්බර අත්දැකීම පාඨකයාට වින්දනයක් ඇති වන පරිදි ඉදිරිපත් කිරීමෙන් ඔහුගේ නිර්මාණශීලීත්වය හෙළි වේ.
(2) සාහිත්‍යකරුවකුගේ නිර්මාණශීලීත්වය මතුවන්නේ තමන් තෝරා ගන්නා අරුත්බර අත්දැකීම වින්දනීය ලෙස ඉදිරිපත් කිරීම නිසා ය.
(3) සාහිත්‍යකරුවකු තෝරාගන්නා අරුත්බර අත්දැකීමක් වින්දනීය ලෙසින් නැවත ඉදිරිපත් කර ඇති ආකාරයෙන් ඔහුගේ නිර්මාණශීලීත්වය හෙළි වේ.
(4) අරුත්බර අත්දැකීමක් තෝරාගෙන එය වින්දනීය ආකාරයෙන් ඉදිරිපත් කළ හැකි නම් එමගින් සාහිත්‍යකරුවකුගේ නිර්මාණශීලීත්වය හෙළි වේ.

* *

[පස්වැනි පිටුව බලන්න.

WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....